# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1426/ 2024

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2024

දිනය
திக
Date — 03/09/2024
පැය 1555

**මාධ්‍ය නිවේදනය**

### 158 වන පොලිස් සංවත්සරය වෙනුවෙන් දිවයින පුරා ආගමික හා ප්‍රජා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරේ.

1866 සැප්තැම්බර් මස 03 වන දින ව්‍යවස්ථාපිතව ආරම්භ කළ පොලිසිය අදට වසර 158 ක ඉතිහාසයකට උරුමකම් කියනු ලබන අතර 2024.09.03 වන අද දිනට යෙදෙන 158 වන සංවත්සර දිනය වෙනුවෙන් දිවයින පුරා පිහිටි පොලිස් වසම්වල පොලිස්ථාන විසින් විවිධ ආගමික හා ප්‍රජා වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

මෙම සංවත්සරයට සමගාමීව ආගමික කටයුතු 2024.08.30 වන දින අනුරාධපුරයේදී ආරම්භ කළ අතර, එහිදී පොලිස් කොට්ඨාස ධජ සඳහා ආශිර්වාද ගැනීම සිදුකරන ලදි. එම අවස්ථාව සඳහා වැඩබලන ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති පරිපාලන ලලිත් පතිනායක මහතා ඇතුළු ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් රැසක් සහභාගි විය.

158 වන පොලිස් සංවත්සරයට සමගාමීව අද දින බෞද්ධ ආගමික වැඩසටහන කොම්පඤ්ඤවීදිය හුනුපිටිය ගංගාරාම විහාරස්ථානය, කතෝලික දේව මෙහෙය මෝදර ශාන්ත ජේම්ස් කතෝලික දේවස්ථානය, හින්දු ආගමික පූජාව බම්බලපිටිය කදිරේෂන් හින්දු කෝවිලේ හා ඉස්ලාම් දේව මෙහෙය කුරුඳුවත්ත දවටගහ මුස්ලිම් දේවස්ථානයන් තුලදී පවත්වන ලදි.

මෙම ආගමික වැඩසටහන් සඳහා ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මැතිතුමා, මහජන ආරක්ෂක අමාත්‍යාංශයේ ගරු ලේකම් වියානි ගුණතිලක මහතා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) ලලිත් පතිනායක මහතා ඇතුළු පොලිස් නිලධාරීන් රැසක් සහභාගි විය.

මීට සමගාමීව දිවයිනේ පිහිටි පොලිස් ස්ථාන 607 ක හා ක්‍රියාකාරි කොට්ඨාස වල නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් විවිධ ආගමික වැඩසටහන්, ප්‍රජා සත්කාරක වැඩසටහන්, ලේ දන් දීමේ වැඩසටහන් රාශියක් ක්‍රියාවට නැංවීමට ද සැලසුම් කර ඇත.

මෙම විවිධ ආගමික හා ප්‍රජා වැඩසටහන්ට අදාල  ඡායාරූප කිහිපයක්












Reserved For Monks Only




D. O. M.
IN HON. S. JACOBI AP.
DICATA
A.D.











**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**